# රාහුල්ගේ රන් බිත්තරය

පීතුම් ධනාරා පතිනායක



# රාහුල්ගේ රන් බිත්තරය

## ජිතුමි ධනාරා පතිනායක

කතෘ

## කතෘගේ වෙනත් කෘති

හා පැංචා ගමන ගියපු හැටි - 2023

අඹ යහළුවෝ -2024

හඳ ගමන -2024

වලස් අම්මාගේ අමුතු කෑම -2024

පොහොය දොලහේ වැදගත්කම -2024

TIMMY AND THE BALL -2024

THE LITTLE FOX AND THE MOON -2024

එකමුතුකමේ අගය -2024

සිතුමියි දිනිතියි -2024

සඳිනි -2024

පුංචි අපේ මුතු -2024

අය්යයි මමයි අක්කයි - 2024

JIMMY -2024



පාසැල: මහාමායා බාලිකා විද්‍යාලය
පංතිය: 5 ශ්‍රේණිය B
කෘතිය පලකරන දිනය: 2026.05.10 දින

ISBN 978-624-208-977-5

# පිදුම

මෙම පොත ලිවිමට මා දිරිමත් කළ

මහනුවර මහාමායා බාලිකා විදුහලේ ගුරු භවතුන් වන

සෙනෙවිරත්න මහලේකම් ගුරු පියානන්

සහ

පංති භාර ගුරු තුමා හේමන්ත තිලකරත්න ගුරු පියානන්ටත්,

නිරන්තරයෙන්  මා හට උදව් කළ මාගේ මෑණියන්, පියානන්,අයියා
සහ අක්කා හට

ඉතා ආදරයෙන් මෙම පොත පුදමි.



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කල හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුලින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කල ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

ඉස්සර කාලේ එක ගමක රාහුල් කියලා ළමයෙක් හිටියා.

ඔහු හොඳ ගතිගුණ ඇති ළමයෙක්.

එයාගෙ පවුලේ හිටියේ අම්මා, තාත්තා, අක්කා සහ රාහුල් පමණය.



රාහුල්ගේ අක්කා රාධාය. එයා හරිම ලස්සනයි.


එයාට දිග රැලි කොණ්ඩයක් තිබුණා.

ඔවුන් හතරදෙනාම සතුටින් ජීවත් වුණා.



ඔවුන් ජීවත් වුණේ ගොවිතැන් කරලයි.

දුප්පත් වුණත් ඔවුන් ළඟ හොඳ ගතිගුණ පිරිලා තිබුණා.




රාහුල් සහ රාධා ගියේ ගමේ පාසලටයි.


එදා වැසි සහිත දවසක්.

පාසල නිම වී ගෙදර යන ගමන් මේ දෙදෙනාට වැස්සට තෙමි තෙමි,පඳුරක් ළඟ ඉන්න

කිකිළි පැටියෙක් දකින්න ලැබුණා.



රාහුල් ඉක්මනින් පැටියා අතට ගත්තා.
රාධා ලේන්සුව අරන් පැටියාගේ
වතුර පිස දැම්මා.



පැටියා තුරුලු කරගත් රාහුල්, රාධාද සමගින් ඉක්මනින් ගෙදර ගියා.

අම්මාටත් තාත්තාටත් හරිම සතුටුයි.

පැටියාට කෑම දුන්නා.

එයාව උණුසුම් කළ රාහුල් එයාට සුදු කියා නම තිබ්බා.



අක්කයි මල්ලියි එකතු වෙලා ලස්සන කූඩුවක් හැදුවා.

තාත්තාද මේ දෙන්නාට උදව් කළා.

අම්මා ද පැටියාට කෑම තියන්න භාජන දෙකක් දුන්නා.

රාධා ඒවාට කෑම දැම්මා.



ටික ටික ලොකු වුණ කිකිළි පැටියා දැන් හරිම ලස්සනයි.

රාහුල්ගෙ ගෙදර හැමෝම මෙයාව ආදරෙන් බලා ගත්තා.

අක්කයි මල්ලියි සෙල්ලම් කරන විට,

කිකිළි පැටියා ද එයාලගෙ පිටිපස්සෙන් දුවගෙන එනවා.



තවත් අලුත් දවසක් උදා වුණා.

එදා පාසල් නිවාඩු දවසක්.

අක්කයි මල්ලියි දෙන්නාම ඉක්මනින්ම ගියේ සුදු බලන්න,

ඒත් එයා කූඩුවේ සිටියේ නැහැ.

රාහුල් හිටියේ හරිම දුකෙන්.

රාධාගේද ඇස්වල කඳුළු පිරී තිබුණා.


එයාල සුදූව හැම තැනකම සෙව්වා.



ටික වෙලාවකින් සුදූ කෑ ගහන සද්දෙ ඇසුණා.

රාහුල් සහ රාධා ඉක්මනින්ම එතැනට දිව ගියා.

එයාලට දකින්න ලැබුණේ කිකිළි ළඟ තිබූ දිලිසෙන බිත්තරයයි.



ඔවුන් තවත් ළංවී බැලූ විට

එය රන් බිතත්තරයක් බව දැක්කා.

රාහුල් ඒක අතට ගත්තා.



අම්මා කිකිළිව අරන් ඇවිත් කූඩුවෙන් තිබ්බා.



රාහුල් රන් බිත්තරය තාත්තාගේ අතට දුන්නා.

රාධා ඉක්මනින්ම කෑම සහ වතුර කූඩුවෙන් තිබ්බා.

කිකිළි ඒවා ඉක්මනින්ම කෑවා.

තාත්තා රන් බිත්තරය මුදලාලිට වික්කා.

ලොකු මුදලක් ද ඊට ලැබුණා.



එම මුදල පරිස්සමින් වියදම් කළා.

පවුලේ හැමෝටමත් උදව් කළා.

එයාල සැවොම සතුටින් ජීවත් වුණා.

සුදු කිකිළිට හැමෝම රන් කිකිළි කීවා.

රන් කිකිළිව ආදරෙන් රැක බලා ගත්තා.



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **හේමමාලා උපහාර** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමෙ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN - 978-624-208-977-5